**ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය**
**සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි**

# ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩල පනත

ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය
සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි

# ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩල පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් අදහස් පළ කිරීමෙ නිදහස සහතික කර ඇති බැවින් ද;

නිබර්ාධිත ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවක් සඳහා වේදිකාවක් වෙමින්, පුරවැසියන්ට පුළුල් පරාසයක තොරතුරු සැපයීමට කැපවෙන, උසස් ආචාරධමර්ීය ප්‍රමිතිවලින් හා වෘත්තීය නිපුණත්වයකින් යුත්, නිදහස්, ස්වාධීන සහ බහුවිධ මාධ්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැගීමට සහ පවත්වා ගෙන යාමට අත්‍යවශ්‍ය බව සලකමින් ද;

1. ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික ජනරජයේ පාලරීමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

   මෙම පනත............දරන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වේ 79 වෙනි ව්‍යවස්ථාව ප්‍රකාර සහතික කිරීමේ දිනයේ සිට ඉක්බිතිව ම වූ දිනයේ දී මේ පනත ක්‍රියාත්මක විය යුතු ය.

## පුවත්පත් මණ්ඩල පනත අවලංගු කිරීම

2. 1979 අංක 5 දරණ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත මේ මගින් අවලංගු කරනු ලැබේ

3. මේ පනතේ අරමුණු සඳහා මේ පනත පහත දැක්වෙන පරිදි සැදුම් ලත් ප්‍රවෘත්ති මාධ්‍ය වලට අදාළ වෙයි:

   3.1 ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශන සහ ඒවායේ අන්තජර්ාල මාදිලි;
   3.2 විද්‍යුත් මාධ්‍ය විකාශන බලපත්‍රයේ සඳහන් වන කොන්දෙසි වලට යටත් ව, ශ්‍රී ලංකාව තුළ විකාශනය කරන හෝ බෙදා හරින විද්‍යුත් මාධ්‍ය සේවා සහ ඒවායේ අන්තජර්ාල මාදිලි;
   3.3 ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය විසින් නිල වශයෙන් පිළිගත් අදාළ ව්‍යවහාර සංග්‍රහ (Codes of Practices) ස්වෙච්ඡාවෙන් පිළිපැදීමට සිය එකඟත්වය විධිමත් ලෙස ලිඛිත ව ප්‍රකාශ කරන සහ ඒ

එකගත්වය තම වෙබ් අඩවි මුල් පිටුවේ අදාළ පරිදි පැහැදිලිව ප්‍රදශර්නය කරන අන්තජර්ාල ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවි.

## මාධ්‍ය නිදහස හා ප්‍රවෘත්ති මාධ්‍ය

4. ජන මාධ්‍ය නිදහස යනු:

අ. ව්‍යවස්ථාව මගින් සහතික කරන ලද අදහස් පළ කිරීමේ අයිතියේ ම අනුපූරකයකි;
ආ.ප්‍රවෘත්ති මාධ්‍යය කිසිදු පූවර් වාරණයකට ලක් කිරීම තහනම් කරන්නකි.

5. සිය මහජන කායර් ඉටු කිරීමේ ලා ප්‍රවෘත්ති මාධ්‍යයට පහත දැක්වෙන අයිති සතු වේ.

5.1. ප්‍රවෘත්ති සහ තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීම;
5.2. නොයෙකුත් වාද විෂයයන් සහ මහජන කටයුතු සම්බන්ධයෙන් විචාරාත්මක වාතර්ාකරණයක නිරත වීම සහ මත පළ කිරීම;
5.3. මහජන මතය හැඩ ගැස්වීමට සහභාගී වීම;

## පළ කිරීමේ අයිතිය

6. මෙම පනතේ විධි විධාන සහ විද්‍යුත් මාධ්‍ය සේවයක් පවත්වා ගෙන යාමට පෙර විකාශන බලපත්‍රයක් ලබාගැනීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ඇති නීතිමය විධිවිධාන වලට පමණක් යටත් ව සැම අයකුට ම ප්‍රවෘත්ති මාධ්‍යයක් පිහිටුවීමේ අයිතිය ඇත්තේ ය.

7. ජනමාධ්‍යය කරුවෙක් විසින් ප්‍රවෘත්ති මාධ්‍යය ආයතනයක් උදෙසා නීත්‍යානුකූල ව ප්‍රවෘත්ති සහ තොරතුරු රැස් කරනු ලැබීම කිසිදු අයෙක් විසින් හිතාමතා නොවැලක් විය යුතු ය.

8. (1). අකටයුත්තක් සම්බන්ධ හෝ සෞඛ්‍යට, නිරාපදාවට හෝ පරිසරයට බරපතළ ලෙස හානි සිදුවිය හැකි අවස්ථාවක් සම්බන්ධව හෝ තොරතුරු හෙළිදරව් කිරීමක දී එම තොරතුරු හෙළිදරව් කිරීම සද්භාවයෙන් සහ ප්‍රමාණවත් තරම් සත්‍යයැයි සැලකීමට තරම් සාක්ෂි ඇතැයි යන විශ්වාසයෙන් කරන්නේ නම් එම තොරතුරු හෙළිදරව් කරන තැනැත්තාගේ රැකියා ගිවිසුම්වල කිනම් කොන්දේසියක් කඩ වුන

ද එම පුද්ගලයාට එරෙහිව නීතිමය, පරිපාලනමය, රැකියාමය දඬුවමක් පැනවිය නොහැක්කේය.

(2) පළමුවැනි උප වගන්තියේ අකටයුත්තක් යන්නට දණ්ඩණීය අපරාධයක් කිරීම, නීතියට අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම, අවභාවිත විනිශ්චය, දූෂණය වංචාව හෝ මහජන ආයතන බරපතළ ලෙස දූෂ්පාලනයට ලක් කිරීම අදහස් කෙරේ.

## ප්‍රභව අනාවරණය නො කිරීමේ අයිතිය

8. රහස්‍ය පදනම මත ප්‍රවෘත්ති මාධ්‍යයකට තොරතුරු සපයන ප්‍රභවයක අනන්‍යතාවය හෙළි කිරීමට කිසිවකුට බල නොකළ යුතු ය.

(අ). රහස්‍යභාවය රැකීමේ කොන්දේසිය මත තොරතුරු සපයන ප්‍රභවයක අනන්‍යතාවය හෙළි කරන ලෙස ජනමාධ්‍යවේදියෙකුගෙන් ඉල්ලීමට හෝ ප්‍රකාශනයක පළ වූ තොරතුර සම්බන්ධ වගකියන ජනමාධ්‍යවේදියෙකු එකී තොරතුරු වල ප්‍රභවය හෙළිදරව් කිරීම ප්‍රතික්ෂෙප කිරීම කරණ කොට ඔහු හෝ ඇය ට එරෙහිව අගතිගාමී නිගමනයකට එළඹීමට කිසිදු අධිකරණයක් කටයුතු නොකළ යුතුය.

(ආ) එසේ වුවද ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජාතික ආරක්ෂාවට අවශ්‍ය සහ ව්‍යාකූලත්වය හෝ අපරාධයක් වැළැක්වීමට එකී හෙළිදරව් කිරීම අවශ්‍ය යැයි ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමට පත් වන්නේ නම් එම තොරතුරු වල ප්‍රභවය හෙළි කරන ලෙස ජනමාධ්‍යවේදියාට නියම කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට හැකිය.

### නිවැරදි කොට පළ කර ගැනීමේ අයිතිය

9. යම් අයකුගේ කීතරීයට හෝ නීත්‍යානුකූල අයිතීන් ට හානි සිදු වෙන පරිදි කරුණුමය වැරදි සහිත තොරතුරක් ප්‍රවෘත්ති මාධ්‍යයක පළ වූ විට, එම තොරතුර පළ වූ මාධ්‍යයේ ම, ගාස්තුවකින් තොර ව, පහත සඳහන් කොන්දේසි වලට යටත් ව, එම වරද නිවැරදි කොට පළ කර ගැනීමේ අයිතියක් එම තැනැත්තාට තිබේ .

(අ). දිනපතා පළ වෙන ප්‍රවෘත්ති ප්‍රකාශනයක, ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක් වන අන්තජර්ාල ප්‍රවෘත්ති මාධ්‍ය සේවයක හෝ විද්‍යුත් මාධ්‍ය අන්තගර්ත සේවයක හෝ නම් නිවැරදි කිරීම ලැබී දින තුනක් ඇතුළත නිවැරදි කිරීම කළ යුතු වන අතර. අනිකුත් ප්‍රවෘත්ති ප්‍රකාශනයක නම් නිවැරදි කිරීම ලැබී දින තුනක් ගත

වීමෙන් පසුව එම ප්‍රවෘත්ති ප්‍රකාශනය ඊළඟට පළ වන විට නිවැරදි කළ යුතු ය;

(ආ). මැතිවරණ සමයක දී නම්, (අ) උප වගන්තියේ සඳහන් දින තුනක කාලය පැය 24 දක්වා අඩු විය යුතු ය;

(ඇ.) නිවැරදි කිරීමක් කරන ලෙස කෙරෙන ඉල්ලීමක් එම ඉල්ලීමට හේතු වූ කරුණ පළ කරන ලද දිනයේ සිට මාසයක් ඉකුත් වීමට පෙර ඉදිරිපත් කළ යුතු ය; .

(ඈ.) කිසියම් ප්‍රවෘත්ති මාධ්‍යයක් නිවැරදි කිරීමක් ඉටු කරලීම ප්‍රතික්ෂේප කළ විට එම නිවැරදි කිරීම ඉටු කර දෙන ලෙස ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍යය තත්ත්ව මණ්ඩලයෙන් ඉල්ලා සිටීමට අදාළ පුද්ගලයාට හැකිය.

10. (ඇ) උප වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍යය තත්ත්ව මණ්ඩලය එම ඉල්ලීම ලැබී සති දෙකක් ඇතුළත සිය තීරණය දැනුම් දිය යුතු ය. එසේ වූ ව ද මැතිවරණ සමයක දී නම්, ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍යය තත්ත්ව මණ්ඩලය ඒ තීරණය සාධාරණ තරම් ඉක්මනින්, ලබා දිය යුතු ය.

## ප්‍රවෘත්ති මාධ්‍යය සම්බන්ධ වගවීම

11. මේ පනතේ අරමුණ සම්බන්ධයෙන් ගත් විට ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක් විසින් නම් කරනු ලබන ප්‍රධාන සංස්කාරක, වෙළඳ දැන්වීම් ද ඇතුළත් ව, ප්‍රවෘත්ති මාධ්‍යය ආයතනය විසින් බෙදා හරිනු ලබන සියලු අන්තගර්තය සම්බන්ධයෙන් වග විය යුතු ය.

12. ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය විසින් පිළිගත් ව්‍යවහාර සංග්‍රහයක් කඩ කිරීමක දී එම කඩ කිරීමේ වගකීම ප්‍රධාන සංස්කාරක වෙත ඍජුව පැවරිය නො හැකි වුව ද ඒ සම්බන්ධයෙන් ප්‍රධාන සංස්කාරක ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලයට වගකිය යුතු ය.

13. කිසිවකු විසින් වත් ප්‍රධාන සංස්කාරකයෙකු, ජනමාධ්‍ය කරුවෙකු හෝ ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක වෙනත් සේවකයෙකු විසින්, ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය විසින් මෙම පනත යටතේ පිළිගත් ව්‍යවහාර සංග්‍රහයක් කඩ කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම නිසා, අඩු සැලකිලි දැක්වීමකට හෝ, සම්බාධකයකට හෝ රැකියාව අවසන් කිරීමකට හෝ ලක් නො කළ යුත්තේ ය.

14. ප්‍රවෘත්ති මාධ්‍ය ආයතන, ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය විසින් පිළිගනු ලැබූ අදාළ ව්‍යවහාර සංග්‍රහ තම සේවකයන් වෙත බෙදා හැරිය යුතු වේ.

15. තමන්ට අභිමත වෘත්තීය සංවිධානයක් හෝ වෘත්තීය සමිතියක් තුළ සංවිධාන ගත වීම ජනමාධ්‍යකරුවන්ගේ අයිතියකි.

## ලියා පදිංචි වීමේ සහතිකය

16. ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක් පළ කරන හෝ පළ කිරීමට අදහස් කරන ඕනෑම අයකු, (18) වෙනි වගන්තියේ දැක්වෙන තොරතුරු සැපයීමෙන්, එවැනි ප්‍රකාශන ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු ය.

17. ලියාපදිංචි කිරීමේ ෆෝරමයේ පහත සඳහන් තොරතුරු අඩංගු විය යුතු ය.
    - (අ.) ප්‍රකාශකයාගේ, ප්‍රධාන සංස්කාරකගේ සහ අදාළ වන පරිදි මුද්‍රණ කරු ගේ නම් හා ලිපිනයන්;
    - (ආ.) මාධ්‍ය ප්‍රකාශනයේ හෝ (3.3) වගන්තිය යටතේ ලියාපදිංචි වන අන්තර්ජාල ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවියේ හෝ නම, ලිපිනය හා ශාඛා කාර්යාලයක් වෙත් නම් එහි ලිපිනය.

18. ලියාපදිංචි කිරීමට යෝජිත ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයේ හෝ අන්තර්ජාල ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවියේ හෝ නම ඒ වන විටත් ලියා පදිංචි කර ඇති කිසියම් ප්‍රකාශනයක් හෝ වෙබ් අඩවියක් හා මුලා වන තරම් ළඟින් සමාන නමක් සහිත නම් වෙනත් නමක් යොදා එය ලියා පදිංචි කිරීම කළ යුතු ය.

19. 18 වැනි වගන්තිය යටතේ දන්වන ලද තොරතුරු වල වෙනසක් සිදු වූ විට දින පහළොවක් ඇතුළත ඒ බව ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය වෙත දැනුම් දිය යුතු ය.

20. ලියාපදිංචිය පහත සඳහන් කරුණු මත අවලංගු විය හැකිය:
    - (අ) ප්‍රකාශනය හෝ ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවිය හෝ පළ කිරීම නතර කිරීම පිළිබඳ ප්‍රකාශක විසින් ලිඛිත ව දැනුම් දීම නිසා;
    - (ආ) ප්‍රකාශනය හෝ ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවිය හෝ බෙදා හැරීම මාස තුනකට වැඩි කාලයක් නතර වී ඇති විට;
    - (ඇ) ලියාපදිංචිය ලබා ගැනීමෙන් පසු වසරක් ගත වීමට පෙර ප්‍රකාශනය හෝ ප්‍රවෘත්ති මාධ්‍ය වෙබ් අඩවිය හෝ ආරම්භ කිරීමට අපොහොසත් වීම නිසා.

## ආමුද්‍රිතය හා පාරිතෝෂික පිටපත්

21. ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක් එහි සෑම සංස්කරණයක ම ප්‍රකාශකගේ නම, මුද්‍රණ කරුගේ නම, ප්‍රධාන සංස්කාරකගේ නම සහ එහි සංස්කරණ අංකය, වාරානුකූලතාවය, සහ ප්‍රකාශනයේ දිනය පළ කළ යුතු ය.

22. විද්‍යුත් මාධ්‍යය සේවයක් සෑම වැඩසටහනක ම ආරම්භයේ සහ අවසානයේ විද්‍යුත් මාධ්‍යයේ නම සහ වැඩසටහන පිළිබඳ වග කියන නිෂ්පාදක ගේ නම ප්‍රචාරය කළ යුතු ය.

23. ජාතික මට්ටමේ බෙදා හැරීමක් ඇති හෝ කොළඹ නගරය මුල් කොට බෙදා හැරීමක් ඇති ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශන, බෙදා හැරීමෙන් පැය විසිහතරක් ගත වීමට පෙර, සෑම සංස්කරණයක ම පිටපත් දෙක බැගින් නොමිලේ ජාතික ලේඛණාගාරයේ තැන්පත් කළ යුතු ය.

24. (24) වැනි වගන්තියේ සඳහන් ප්‍රකාශන හැරෙන විට අනෙකුත් ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශන පිටපත් දෙක බැගින් මාස හයක් ගතවන තුරු සිය ප්‍රකාශන ස්ථානයේ තබා ගත යුතු ය.

25. විද්‍යුත් මාධ්‍යය ප්‍රචාරය කරන සියලු ම ප්‍රචාරක ද්‍රව්‍ය හා වැඩසටහන් හය මසක් ඉකුත් වෙන තෙක් තබා ගත යුතු ය.

26. ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක් විසින් බෙදා හරින අන්තගර්තයක් ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය හෝ අධිකරණයක් හමුවේ ඇති පැමිණිල්ලකට හේතුවක් වී ඇති විට (25) වැනි සහ (26) වැනි වගන්ති වල සඳහන් කළ තබා ගැනීමේ කාල සීමාව එම පැමිණිල්ල සම්බන්ධව ගත හැකි වෙනත් අභියාචනා අවස්ථාවක් නොමැති වන තෙක් දික් කළ බව ට සැලකිය යුතු ය.

## ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය

27. මේ පනතේ කාර්ය සඳහා ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන (මින් මතු 'මණ්ඩලය' යනුවෙන් සඳහන් කරන) මණ්ඩලයක් පිහිටු විය යුතු ය. මණ්ඩලයේ පරමාථර්ය වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රවෘත්ති මාධ්‍ය නිදහස සුරක්ෂිත කිරීම සහ ප්‍රවෘත්ති මාධ්‍ය වල තත්වය ඉහළ මට්ටමකට දියුණු කිරීම හා පවත්වා ගෙන යාම වේ.

28. මණ්ඩලය (28) වැනි වගන්තියේ එයට දෙන නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර ඒ නාමයෙන් එය විසින් ද ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

29.

(අ.) මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිදෙර්ශය පරිදි ජනාධිපති තුමා විසින් පත් කළ සාමාජිකයන් දහතුන් (13) දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(ආ.) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව (අ.) උප වගන්තිය යටතේ සිය වගකීම ඉටු කරන විට පහත දැක්වෙන ආකාරයට අනුව නිදෙර්ශ ඉදිරිපත් කළ යුතු ය:

(i). ප්‍රවෘත්ති මාධ්‍යය ප්‍රකාශකයන්, ප්‍රවෘත්ති මාධ්‍යය අයිතිකරුවන් හා ප්‍රධාන සංස්කාරකවරුන්ගේ සංවිධාන විසින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා අතරින් තෝරා ගත් විශිෂ්ට පුද්ගලයන් සිව් දෙනෙක්;

(ii). වෘත්තීය ප්‍රවෘත්ති මාධ්‍යය කරුවන්ගේ සමිති හා සංවිධාන විසින් ඉදිරිපත් කරන නාම යෝජනා අතරින් තෝරා ගත් විශිෂ්ට පුද්ගලයන් සිව් දෙනෙක්;

(iii). ශ්‍රී ලංකා පුවත් පත් ආයතනය විසින් සංවිධානය කොට පවත්වනු ලබන මහජන උපදේශනයක් මගින් නාම යෝජනා කරනු ලබන අය අතරින් තෝරා ගත් ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක නොවන විශිෂ්ට පුද්ගලයන් සිව් දෙනෙක් හෝ ශ්‍රී ලංකා පුවත් පත් ආයතනය විසින් එසේ මහජන උපදේශනයක් මගින් නාම යෝජනා නො කරන්නේ නම්, මානව අයිතිවාසිකම්, නීතියේ ආධිපත්‍ය, අදහස් පළ කිරීමේ නිදහස හෝ තොරතුරු ලබා ගැනීමේ අයිතිය හෝ ප්‍රවර්ධනය කිරීමට දායකත්වය ලබා දී ඇති වෘත්තීය හා සිවිල් සමාජ සංවිධාන විසින් ඉදිරිපත් කරන නාම යෝජනා අතරින් තෝරා ගත් විශිෂ්ට පුද්ගලයන් සිව් දෙනෙක්;

(iv). මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කිරීම පිණිස ශ්‍රී ලංකා නීතිඥ සංගමය විමසා යෝජනා කරනු ලබන ප්‍රවීණ නීතිවේදියෙකු විශ්‍රාමලත් විනිසුරුවරයෙකු හෝ නීති ශාස්ත්‍රඥයෙකු

(ඇ.) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අදාළ සංවිධාන වලින් කැඳවනු ලබන නාම යෝජනා මත උප වගන්ති (ආ) යටතේ සඳහන් නිදේශ කිරීම් කළ යුතු අතර එක ම කළමනාකරණයකින් හෝ හිමිකමකින් පාලනය වන ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයකින් හෝ ප්‍රවෘත්ති මාධ්‍ය ආයතන සමූහයකින් එක් අයකුට වැඩි නොවන සේ එම නිදේශ කිරීම කළ යුතු ය.

30. 30 වැනි වගන්තිය යටතේ සිය නිදේශ ඉදිරිපත් කිරීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව (30)-(අ) (i), (ii) සහ (iii )යන උප වගන්ති වල සඳහන් ප්‍රවගර් තුනෙන් [අවම වශයෙන්] පුද්ගලයන් අට දෙනෙකු දක්වා වූ ලැයිස්තුවක් පිළියෙළ කොට ප්‍රසිද්ධ මහජන අදහස් විමසීමකින් එකඟත්වයට පැමිණීමෙන් පසු එක් එක් ප්‍රවගර් කණ්ඩායමට අනුකූලව මණ්ඩලයට සාමාජිකයන් තෝරා නිදේශ කළ යුත්තේ ය. එසේ නිදේශ කරන සාමාජිකයන් භාෂා හා ජනවගර්, කාන්තාවන් හා භූගෝලීය කලාපවල නියෝජනයක් ද නිරූපණය කළ යුතු අතර දැනුම, අත්දැකීම් හා විශිෂ්ටත්වය අතින් ගත් විට මානව අයිතීන්, පුවත්පත් කලාව, ජන මාධ්‍ය, නීතිය , දේශපාලන විද්‍යාව හා සමාජ විද්‍යාව, විද්‍යාව, සාහිත්‍ය හෝ අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍රවල නිපුණයන් වශයෙන් මහජන පිළිගැනීමක් ඇති අය විය යුතු ය.

31. (අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මතය අනුව අදාළ උපමාන අනුව සුදුසුකම් ඇති විශිෂ්ට පුද්ගලයන් සහිත නාම යෝජනා ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලැබී නැත්නම් තවත් වරක් නව නාම යෝජනා කැඳවිය යුත්තේ ය.

(ආ). මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කිරීම පිණිස සලකා බැලෙන ඕනෑම පුද්ගලයෙකුගෙන් සිය නිදේශ කටයුතු ඉටු කිරීම පිණිස අවශ්‍ය වෙතැයි සැලකෙන තොරතුරු ඉල්ලා සිටීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට හැකිය.

32. මේ පනත බලාත්මක වීමෙන් මාස තුනක් ඉකුත්වීමට පෙර සහ ඉන් අනතුරුව මණ්ඩලයේ පුරප්පාඩු ඇති වූ හැම විටක දීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව (30) වැනි වගන්තියේ සඳහන් වන පරිදි සිය නිදේශ ඉදිරිපත් කළ යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නියම කරනු ලබන සාධාරණ කාල සීමාවක් තුළ අදාළ සංවිධාන නාම යෝජනා ඉදිරිපත් කිරීමට අසමත් වුව හොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව (30) සහ (31) වැනි වගන්ති වල සඳහන් වන නියෝජන සැලැස්ම සලකමින් සිය නිදේශ ඉදිරිපත් කළ යුත්තේ ය.

33. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් මණ්ඩලයේ සභාපති හා සාමාජිකයන් වශයෙන් පත් කිරීම පිණිස එවනු ලබන නිදේශ ලැබීමෙන් දින දාහතරක් ඉකුත් වීමට පෙර ජනාධිපතිවරයා විසින් එම පත්වීම් සිදු කළ යුත්තේ ය. කිසියම් අයුරකින් එම දින දාහතරක කාලය තුළ එකී පත්වීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන්නේ නම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිදෙර්ශ කරන ලද පුද්ගලයන් එකී කාල පරිච්ඡේදය ඉකුත් වූ දින සිට මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත් වූ බව ට සැලකිය යුත්තේ ය.

34. මණ්ඩලයේ සාමාජිකයෙකුගේ නිල කාලය අවුරුදු හතරක් වන අතර උපරිම වශයෙන් නිල කාල දෙකකට නො වැඩි වන සේ නැවත තෝරා පත් කර ගත හැකි වන්නේ ය.

35. මණ්ඩලය විසින්:

(අ). මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කළමනාකරණ අධ්‍යක්ෂවරයෙකු; සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා විමසා අවශ්‍ය යැයි සලකන කාර්ය මණ්ඩලයක් පත් කළ යුතු ය.

(ආ). මණ්ඩලයේ පොදු පාලන හා කළමනාකරණ කටයුතු කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ විනය පාලනය කළමනාකරණ අධ්‍යක්ෂක ගේ වගකීමකි.

(ඇ) (අ.) උප වගන්තිය යටතේ පත් කරනු ලබන කළමනාකරණ අධ්‍යක්ෂකවරයා සහ කාර්ය මණ්ඩලය, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමයන් සහ සේවා කොන්දේසි වලට යටත් වන අතර ඔවුන්ගේ වැටුප්, මුදල් විෂය භාර ඇමතිවරයා හා සාකච්ඡා කොට මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

## මණ්ඩලයේ කාර්ය සහ මණ්ඩලය සතු බලතල

36. (අ) මේ පනත යටතේ සිය කාර්යයන් ඉටු කිරීමේ දී සහ බලය භාවිතා කිරීමේ දී මණ්ඩලය, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට සහ නීතියට පමණක් යටත් ව ස්වාධීනව ක්‍රියා කළ යුතු අතර අපක්ෂපාතී ව හා අගති සිතකින් හෝ පක්ෂග්‍රාහී වීමකින් හෝ බියකින් හෝ තොර ව එහි කාර්යන් ඉටු කළ යුතු ය. කිසිදු දේශපාලන හෝ වෙනත් බැඳීමකින් හෝ ඇඟිලි ගැසීමකට ලක් වීමෙන් හෝ තොර ව මණ්ඩලය කටයුතු කළ යුතු අතර ආණ්ඩුවේ සහ එහි පරිපාලනයේ හෝ දේශපාලන පක්ෂයක හෝ කිසියම් මාධ්‍ය හිමිකරුවකුගේ හෝ වෙළඳ ප්‍රචාරකයෙකුගේ සහ ආණ්ඩුවේ හෝ දේශපාලන පක්ෂයක හෝ කිසියම් මාධ්‍ය හිමිකරුවකුගේ හෝ වෙළඳ ප්‍රචාරකයෙකුගේ අවශ්‍යතා සෘජුව හෝ වක්‍රව නියෝජනය කරන කෙනෙකුගේ හෝ ආයතනයක හෝ බලපෑමෙන් සහමුලින්ම නිදහස් ව ක්‍රියා කළ යුතු ය. සිය කාර්ය හා කතර්ව්‍යය ඉටු කිරීමේ දී මණ්ඩලය අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සුරැකීමට හා මහජන යහපත ඉටු කිරීමට මුල් තැන දිය යුතු ය.

ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය
සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි

**(ආ). මණ්ඩලයේ නිල කාර්යන් හා කතර්ව්‍යය වන්නේ:**

i. ප්‍රවෘත්ති මාධ්‍යය හිමිකරුවන්, ප්‍රවෘත්ති මාධ්‍යය ප්‍රකාශකයන්, ප්‍රවෘත්ති මාධ්‍යය සංස්කාරකවරු, ප්‍රවෘත්ති මාධ්‍යය කරුවන් සහ ප්‍රවෘත්ති මාධ්‍යය ආයතන වල සේවකයන් නියෝජනය කරන සංවිධාන, ප්‍රවෘත්ති මාධ්‍යයට අදාළ ක්ෂේත්‍ර වල නියුතු විශේෂඥයන් සහ අදාළ සිවිල් සමාජ සංවිධාන ද ඇතුළත් ව අනෙකුත් පරදු දරන සංවිධාන වලට මණ්ඩලයේ උපදේශන තත්ත්වය පිරිනැමීම;

ii. ප්‍රථම මණ්ඩලය පත් කිරීමෙන් පසු මාස හතරක් ඇතුළත හා ඉන් අනතුරුව අවශ්‍යතාවක් ඇති වන පරිදි, මණ්ඩලයේ උපදේශන තත්ත්වය දරන විශේෂඥයන්, ප්‍රවෘත්ති මාධ්‍යය සංස්කාරකවරුන්ගේ සහ ප්‍රවෘත්ති මාධ්‍යය කරුවන්ගේ සංවිධාන හා වෘත්තීය සමිති හා සිවිල් සංවිධාන ද ඇතුළුව පරදු දරන සංවිධාන සමග ප්‍රසිද්ධ උපදේශනයක් පවත්වා උසස් තත්ත්ව ලෙස ඉහළ ඇගයීමක් සහ අන්තර්ජාතික පිළිගැනීමක් ඇති ප්‍රවෘත්ති මාධ්‍යය ව්‍යවහාර සංග්‍රහ පදනම් කොට ගත් ප්‍රවෘත්ති මාධ්‍යය ව්‍යවහාර සංග්‍රහ තීරණය කොට පිළිගැනීම;

iii. (ආ)-(ii) උප වගන්තිය යටතේ පිළිගත් ව්‍යවහාර සංග්‍රහ අවම වශයෙන් සෑම වසර තුනක් පාසා මණ්ඩලයේ උපදේශන තත්ත්වය දරන පරදු දරන්නන් සමග පවත්වන උපදේශනයකින් විමශර්නයකට ලක් කොට අවශ්‍ය නම් සංශෝධන හඳුන්වා දීම;

iv. මණ්ඩලය විසින් පිළිගනු ලැබූ ව්‍යවහාර සංග්‍රහ නිසි පරිදි අනුගමනය කිරීම සාක්ෂාත් කර ගැනීම පිණිස ප්‍රවෘත්ති මාධ්‍යය ආයතන වල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීම;.

v. මණ්ඩලය විසින් පිළිගත් ව්‍යවහාර සංග්‍රහ උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි මත හෝ මණ්ඩලය විසින් ම කරනු ලබන නිරීක්ෂණ අනුව විභාග කිරීම සහ පැමිණිලි සම්බන්ධයෙන් තීරණ ගැනීම;

vi. නිවැරදි කිරීමේ අයිතිය ප්‍රවෘත්ති මාධ්‍යයක් විසින් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ චෝදනා ඒ නිසා අගතියට පත් අයගෙන් ලැබෙන පැමිණිලි මත විමසා විභාග කිරීම;

vii. මණ්ඩලය විසින් පිළිගත් ව්‍යවහාර සංග්‍රහ උල්ලංඝනය කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා ප්‍රවෘත්ති මාධ්‍යය වල ජන මාධ්‍යය කරුවන් හා සේවා නියුක්තිකයන් තර්ජනයට, බාධා කිරීම්වලට, අඩු සැලකිලි දැක්වීම් වලට හෝ පලි ගැනීම් වලට ලක් කිරීමේ චෝදනා පිළිබඳ ලැබෙන පැමිණිලි විමසා විභාග කිරීම;

viii. විභාග කිරීම් සම්බන්ධ කාර්ය පටිපාටි තීරණය කර ස්ථාපනය කොට ප්‍රකාශයට පත් කිරීම;

ix. අදාළ සංවිධාන වලට (37)-(ආ)-(i) වගන්තිය යටතේ උපදේශන තත්වය පිරිනැමීම සම්බන්ධ කාර්ය පටිපාටි තීරණය කර ස්ථාපනය කොට ප්‍රකාශයට පත් කිරීම ;

x. ප්‍රවෘත්ති මාධ්‍යය වල අයිති කරුවන්, සමාගම් අධ්‍යක්ෂවරු, 5% වැඩි කොටස් හිමියන්, ප්‍රකාශකයන්, ප්‍රධාන සංස්කාරකවරු, මුද්‍රණ කරුවන්, ප්‍රවෘත්ති මාධ්‍යය ප්‍රකාශන වල බෙදාහැරීම පිළිබඳ සංඛ්‍යා විස්තර සහ මණ්ඩලය විසින් උපදේශන තත්වය පිරිනමන ලද විශේෂඥයන් සහ සංවිධාන වල විස්තර ඇතුළත් ප්‍රසිද්ධ රෙජිස්තරයක් පවත්වා ගෙන යාම සහ මණ්ඩලයේ නිල වෙබ් අඩවියේ එම විස්තර පළ කිරීම;

xi. පිළිගත් ව්‍යවහාර සංග්‍රහ කාර්යක්ෂමව ක්‍රියාත්මක පිළිබඳ ව හා පුවත් කලාවේ මූල ධර්ම පිළිබඳ පුහුණු ද්‍රව්‍ය හා ප්‍රකාශන නිපදවීම, පුහුණු කිරීම් වල යෙදීම හෝ පුහුණු කිරීම් වලට සහය ලබා දීම;

xii. මාධ්‍යයකට එරෙහිව අපහාස කිරීමේ චෝදනා එල්ල වූ විට මේ පනතේ (40) වන වගන්තිය යටතේ විභාග කිරීම;

xiii. ප්‍රවෘත්ති මාධ්‍යය නිදහස සහ ප්‍රවෘත්ති මාධ්‍යය කරුවන්ගේ හා මාධ්‍ය සේවකයන්ගේ ආරක්ෂාව සඳහා යහපත් වාතාවරණයක් ගොඩනැගීමේලා ආණ්ඩුවට උපදෙස් දීම;

xiv. ප්‍රවෘත්ති මාධ්‍යය විසින් ව්‍යවහාර සංග්‍රහ පිළිපැදීම පිළිබඳ ව මහජන මතය විමසීම පිණිස අඩු ම වශයෙන් වසරකට වරක් වත් උප ලේඛනයේ සඳහන් ආකාරයට විවෘත මහජන උපදේශන පැවැත්වීම;

xv. මේ පනතේ අවශ්‍යතා හා පනත යටතේ පුද්ගලයන් සතු අයිතිවාසිකම් පිළිබඳ ව ප්‍රචාරය කිරීම.

ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය
සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි

37. මේ පනත යටතේ ගැනෙන කායර්න් ඉටු කරලීම පිණිස මණ්ඩලයට පහත දැක්වෙන බලතල හිමි වේ.

(අ). ප්‍රවෘත්ති මාධ්‍යය ප්‍රකාශකයින්ගේ, සංස්කාරකවරුන්ගේ, මාධ්‍ය සේවකයන් නියෝජනය කරන සංවිධාන සහ අදාළ සිවිල් සමාජ සංවිධාන වෙත උපදේශන තත්ත්වය පිරිනැමීම;

(ආ). ප්‍රවෘත්ති මාධ්‍යය සඳහා ව්‍යවහාර සංග්‍රහ පිළිගැනීම;

(ඇ). (37)-(ආ) උප වගන්තියේ සඳහන් විභාග කිරීම් ද ඇතුළුව මණ්ඩලයේ කටයුතු කර ගෙන යාම පිණිස අවශ්‍ය කායර් පටිපාටි සකස් කිරීම;

(ඈ). විභාග කිරීම පිණිස පැමිණිලි භාර ගැනීම හා අදාළ නොවන පැමිණිලි ප්‍රතික්ෂේප කිරීම;

(ඉ). මේ පනත යටතේ විභාග කිරීම් පැවැත්වීම සහ ඒ සඳහා පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකු වෙත නියම කිරීම;

(ඊ). දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම යටතේ එම තැනැත්තා විභාග කිරීම හා අවශ්‍ය අවස්ථාවල එම තැනැත්තාගේ සන්තකයේ පවතින යම් තොරතුරු සපයන ලෙස එම තැනැත්තා වෙත නියම කිරීම;

(උ). මේ පනතේ කායර්න් ඉටු කිරීමට අවශ්‍ය වෙන, ප්‍රවෘත්ති මාධ්‍ය ආයතන වල ඇති ඕනෑම තොරතුරක් ලබා ගැනීම;

ඌ). පිළිගත් ව්‍යවහාර සංග්‍රහ කඩ කිරීම නිසා අගතියට පත් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සම්බන්ධ විභාග කොට තීරණය කිරීම; ,
ප්‍රවෘත්ති මාධ්‍යයකට, ප්‍රධාන සංස්කාරක වරයෙකුට හෝ ජනමාධ්‍ය කරුවෙකුට අවවාද කිරීම හෝ දැන මුතු කම් දීම සහ ප්‍රවෘත්ති මාධ්‍යයක, ප්‍රධාන සංස්කාරක වරයෙකු හෝ ජනමාධ්‍ය කරුවෙකු ගේ හැසිරීම සම්බන්ධ අරුචිය ප්‍රකාශ කිරීම.

(එ). ව්‍යවහාර සංග්‍රහ බලාත්මක කිරීමේ දී සේව්‍යයන් සහ සේවකයන් අතර ඇති වන ආරවුල් සමථයකට පත් කිරීමට මැදිහත් වීම.

(ඒ). මහජන යහපත සඳහා අවශ්‍ය වෙතැයි මණ්ඩලය සලකන අවස්ථාවල දී මණ්ඩලයේ තීරණ, මණ්ඩලය විසින් නිණර්ය කරන අන්දමට ප්‍රකාශ හෝ විකාශනය කිරීමට ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයකට නියම කිරීම ;

(ඔ). ව්‍යවහාර සංග්‍රහයකට පටහැණි යයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙළඳ දැන්වීම් පළ කිරීමෙන් හෝ විකාශනය කිරීමෙන් වළකින ලෙස ප්‍රවෘත්ති මාධ්‍යයකට නියම කිරීම;

(ඕ). නිවැරදි කිරීමක් මණ්ඩලය විසින් නියම කරන පරිදි පළ කිරීම හෝ විකාශනය කිරීමට නියම කිරීම;

(ඛ). මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාර්යන් ඉටු කිරීම පිණිස මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් හෝ සාමාජිකයන් නොවන අයගෙන් හෝ එම දෙවගර්යෙන් යුත් කාරක සභා පත් කිරීම. කෙසේ වෙතත් සාමාජිකයන් නොවන අයගෙන් සමන්විත කාරක සභාවලට කළ හැකි වන්නේ මණ්ඩලයට උපදෙස් දීම පමණකි.

(ග). සුදුසු කොන්දේසි මත මණ්ඩලයේ සභාපතිවරයාට හෝ සාමාජිකයන්ගෙන් සමන්විත අනු මණ්ඩලයකට මණ්ඩලය සතු ඕනෑම බලයක් පැවරීම.

(ඝ). (37)-(ආ)-(xv) වන උප වගන්තියට අනුව නියමිත ගාස්තු ප්‍රවෘත්ති මාධ්‍ය වලින් අය කර ගැනීම;

එසේ වුව ද, මේ වගන්තියේ සඳහන් කිසිවක් ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයකට, ප්‍රධාන සංස්කාරක වරයෙකුට හෝ ජනමාධ්‍යය කරුවෙකුට ඔවුන්ට ලැබුණු හෝ ඔවුන් විසින් පළ කරනු ලැබූ කිසියම් ප්‍රවෘත්තියක හෝ තොරතුරක ප්‍රභවය හෙළිදරව් කරන ලෙස බල කිරීමට පැවරෙන බලයක් ලෙස නො සැලකිය යුතු ය.

38. (අ) මණ්ඩලය, පහත දැක්වෙන නීති වලට අනුකූලව, අඩු ම වශයෙන් සෑම මසකට වරක් හෝ එහි කටයුතු ඉටු කිරීමට අවශ්‍ය යයි හැඟෙන තරම් වාර ගණනක් හෝ රැස් විය යුතු ය.

i. එහි ආරම්භක රැස්වීමේ දී මණ්ඩලය සිය සාමාජිකයන් අතරින් උප සභාපතිවරයෙකු හා ලේකම්වරයෙකු පත් කර ගත යුත්තේ ය.
ii. මෙම පනතේ විධිවිධාන වලට යටත් ව, මණ්ඩලය එහි කාර්ය හා කතර්ව්‍යය ඉටු කිරීමට අවශ්‍ය යයි සලකන පරිදි රැස්වීම්, පැමිණිලි, විභාග පටිපාටි සහ අනෙකුත් කරුණු පිළිබඳ ව විධි විධාන හා නීති සම්මත කොට ප්‍රකාශයට පත් කළ යුතු ය මණ්ඩලයේ කතර්ව්‍යය එකී නීති අනුව ඉටු කළ යුතු ය..
iii. මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය හත් දෙනෙකු විය යුතු ය. ]
iv. මණ්ඩලය විසින් වෙනත් ආකාරයකින් විය යුතු යයි තීරණය කර නැත්නම් මණ්ඩලයේ තීරණයක් පැමිණ සිටින සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් ගත යුතු ය. එහෙත් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබෙන අවස්ථාවක දී මුලසුනේ සිටින සාමාජිකයාට ඔහුගේ හෝ ඇයගේ මුල් ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමි විය යුතු ය .
v. මණ්ඩලයේ සියලු රැස්වීම් වල මුලසුන සභාපති විසින් දැරිය යුතු

ය. එහෙත් සභාපති නොමැති අවස්ථාවක දී උප සභාපති විසින් ද සභාපති හා උප සභාපති නොමැති අවස්ථා වක දී පැමිණ සිටින සාමාජිකයන් ඔවුන් අතරින් තෝරා පත්කරගත් සාමාජිකයෙකු විසින් ද එම රැස්වීමේ සභාපති ධුරය දැරිය යුත්තේ ය.

vi. ඕනෑම කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් තීරණයක් ගනු ලැබීමේ දී හෝ මණ්ඩලයේ වෙනත් කතර්ව්‍යයක දී ඒ කාරණය හෝ කතර්ව්‍යය සම්බන්ධයෙන් කිසියම් සාමාජිකයෙකුට ළබැදියාවක් ඇත් නම් එම තීරණය ගනු ලබන රැස්වීමේ දී හෝ වෙනත් කතර්ව්‍යයක් නම් එය ඇරඹීමට පෙර එම ළබැදියාවේ ස්වාභාවය අනාවරණය කළ යුතු ය. එම අනාවරණය රැස්වීමේ හෝ වෙනත් කතර්ව්‍යයේ හෝ වාතර්ාවේ සටහන් කළ යුතු අතර එකී සාමාජිකයා එතැන් සිට එම කාරණය ගැන මණ්ඩලය විසින් කරනු ලබන සාකච්ඡා හෝ තීරණ ගැනීම් වලට සහභාගී නො විය යුතු ය;

vii. මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ රැස්වීම් වල කටයුතු පිළිබඳ විධි විධාන නියාමනය කළ යුතු ය.

viii. මණ්ඩලය විසින් කරනු ලබන ක්‍රියාවක්, ගනු ලබන තීරණයක් හෝ පවත්වන රැස්වීමක් හුදෙක් මණ්ඩලයේ සාමාජික පුරප්පාඩුවක් හෝ ඕනෑම සාමාජිකයෙකු පත් කිරීමේ දී ඇති වූ දෝෂයක් නිසා හෝ අවලංගු නො විය යුතු ය.

(ආ). මේ පනතේ උප ලේඛනයේ සඳහන් විධි විධාන මණ්ඩලයේ සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## ප්‍රවෘත්ති මාධ්‍ය ට එරෙහිව අපහාස චෝදනා ගැන කටයුතු කිරීම

39. අපහාස චෝදනාවක් ඉදිරිපත් කිරීමෙදී ඒ සම්බන්ධයෙන් පිළිගත් ව්‍යවහාර සංග්‍රහයක් කඩව ඇත්දැයි තීරණය කිරීම පිණිස අගතියට පත් පුද්ගලයා විසින් පළමු ව මණ්ඩලය ට කරනු ලබන පැමිණිල්ලක් විභාග කිරීමකින් තොර ව කිසිවකු විසින් වත් මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති ප්‍රවෘත්ති මාධ්‍යයකට එරෙහිව උසාවියක් හමුවේ අපහාස නඩුවක් ගොනු නො කළ යුතු ය.

40. කිසියම් පුද්ගලයෙක් මණ්ඩලය විසින් ගනු ලබන තීරණයකට අනතුරුව තවදුරටත් අපහාසය සම්බන්ධයෙන් වන්දි ඉල්ලා උසාවියක නඩුවක් පැවරීමට කටයුතු කරන්නේ නම් අයැදුම් කරනු ලබන වන්දි මුදලින් **10%** කට සමාන මුදල් ප්‍රමාණයක් මණ්ඩලය වෙත තැන්පත් කළ යුතු වේ. ]

41. (41) වැනි වගන්තිය යටතේ තැන්පත් කරනු ලබන මුදලක් අභියාචනා අවසානයේ දී උසාවිය තීන්දු කරන පරිදි මණ්ඩලය සතු කිරීම හෝ අදාළ පුද්ගලයා වෙත මුදා හැරීම කළ යුතු ය. ]

ප්‍රවෘත්ති මාධ්‍යයක් මගින් අපහාසාත්මක ප්‍රකාශයක් කිරීම පිළිබඳ චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියක් නඩු විභාගයක් පවත්වන විට ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනය අදාළ ප්‍රකාශය පළ කිරීම යුක්ති සහගත සාධාරණ ක්‍රියාවක් දැයි උසාවිය විසින් තීරණය කරනු ලැබීමේ දී එම ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනය කොතෙක් දුරට ව්‍යවහාර සංග්‍රහ පිළිපදිනු ලැබ ඇත් ද? සහ මණ්ඩලයේ නියමයන් අනුව කටයුතු කර ඇත් ද? යන්න සැලකිල්ලට ගත යුතු ය.

## මණ්ඩලය සතු මුක්තිය

42. මණ්ඩලයට පවරා ඇති බලයක් භාවිතා කිරීමේ දී හෝ නියමිත කතර්ව්‍යයක් ඉටු කිරීමේ දී මණ්ඩලය හෝ එහි සාමාජිකයෙක් හෝ මණ්ඩලයේ සේවා නියුක්තිකයෙක් විසින් හෝ සද්භාවයෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධමය වග වීමක් ආරෝපණය නො කළ යුත්තේ ය.

## මණ්ඩලයේ තීරණ වලට එරෙහි අභියාචනා කිරීම

43. (37)-(ආ)-(v),(vi) සහ (vii), වන උප වගන්ති යටතේ මණ්ඩලය විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් පුද්ගලයෙකු හෝ ප්‍රවෘත්ති මාධ්‍යය ආයතනයක් විසින්, ඒ තීරණයට එරෙහිව, එම තීරණය එකී පුද්ගලයා හෝ ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනය වෙත දැනුම් දෙනු ලැබූ දිනයේ සිට මාසයක් ඇතුළත අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

44. යම් අභියාචනයකට අදාළ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන මාගර්යෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළ ව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති, 44 වන වගන්තිය යටතේ කරන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කර ගනු ලැබිය යුතු ය.

## මණ්ඩලය සහ එහි කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන

45. මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු අතර ඒ අරමුදලට පහත සඳහන් මුදල් බැර කළ යුතු ය.

(අ.) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා (47), (**48**) සහ (**49**) වැනි වගන්තිය අනුව පාලරීමේන්තුව විසින් කලින් කලට සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ.) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ඕනෑම මූලාශ්‍රයකින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන එම පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වල මූලාශ්‍ර සහ ඒවා ප්‍රදානය කරනු ලබන අරමුණු ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය යන කොන්දේසියට යටත් ව ;

(ඇ). (37)-(ආ )-(xv). උප වගන්තියට අනුව ප්‍රවෘත්ති මාධ්‍ය වලින් අය කර ගත් ගාස්තු;

(ඉ). පනතේ (59) වැනි වගන්තිය යටතේ අධිකරණය විසින් නියම කරන ලද සියලු දඩ මුදල්.

46. හැම මුදල් වෂර්යක් සඳහා ම අවශ්‍ය අයවැය පිළියෙළ කොට කලින් මුදල් වෂර්ය අවසාන වීමට දින **90** කට පෙර මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා ට ඉදිරිපත් කළ යුතු අතර එම අයවැයේ :

(අ). බලාපොරොත්තු වන ආදායම හා වියදම ප්‍රවගර් වලට වෙන් කොට විස්තර කළ යුතු ය;

(ආ). එම ආදායම සාධාරණීකරණය කිරීම පිණිස එළඹෙන වෂර්ය සඳහා ඉටු කිරීමට බලාපොරොත්තු වෙන කටයුතු පිළිබඳ එක් එක් ප්‍රවගර්යට අනුව විස්තර ද ඉදිරිපත් කළ යුතු ය.

47. පනතේ (**47**) වැනි වගන්තියට අනුව පිළියෙළ කරන ලද අයවැය ලැබීමෙන් පසු මුදල් විෂයය භාර අමාත්‍යවරයා :

(අ) එම අයවැයේ පිටපතක් පාලරීමේන්තුවේ අනුමැතිය පිණිස පාලරීමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර ;

(ආ) එවැනි අයවැයක අඩංගු කරුණු පිළිබඳ ව පාලරීමේන්තුවට හෝ පාලරීමේන්තුවේ කමිටුවකට කරුණු පැහැදිලි කරන ලෙස මණ්ඩලයේ සාමාජිකයන් ට දන්වනු ලැබිය හැකි ය ; සහ

(ඇ) එවැනි අයවැයක් මහජනතාවගේ දැන ගැනීම පිණිස ඔහු හෝ ඇය විසින් සුදුසුයි සිතෙන ආකාරයකට ප්‍රකාශයට පත් කරන ලෙස මණ්ඩලයට දැනුම් දිය හැකිය.

48. එවැනි අයවැයක් පාලරීමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු දින **90**ක් ඇතුළත පාලරීමේන්තුව විසින් විරුද්ධත්වයක් දක්වා නැත් නම් එම අයවැය සම්මත වූ බවට සැලකිය යුතු ය.

49. ඕනෑම වෂර්යක් සඳහා වන අයවැයක් එම වෂර්යේ දී සංශෝධනය කිරීමට මණ්ඩලයට හැකි අතර එවැනි සංශෝධන (47) වන වගන්තියේ පරිදි මුදල් විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතු ය. එවැනි අවස්ථාවල දී (48) සහ (49) වගන්ති ද සුදුසු වෙනස්කම් සහිත ව අදාළ වේ.

50. ඕනෑම වෂර්යක් සඳහා මණ්ඩලය විසින් පාලර්මේන්තුවෙන් ඉල්ලා සිටින ඇස්තමේන්තු මුදල වඩාත් ම මෑත වෂර්ය සඳහා වරින් වර සංශෝධනය කොට පාලර්මේන්තුව විසින් අනුමත කරන ලද මුදලට වඩා අඩු නො කළ යුතු ය.

51. මණ්ඩලයේ එක වෂර්යක ආදායම වියදම ඉක්මවා ඉතුරු වූ විට එම ඉතුරු මුදල ඊළඟ වෂර්ය සඳහා ගෙන යා හැකි ය.

52. මණ්ඩලයේ මුදල් වෂර්ය ලිත් වෂර්ය විය යුතු අතර පහත සඳහන් විධි විධාන අදාළ වේ:

(අ). මණ්ඩලය විසින්, සිය ආදායම් සහ වියදම් සහ මණ්ඩලයේ අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වා ගෙන යා යුතු ය.

(ආ). රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සඳහා අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(ඇ). 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, මණ්ඩලයේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

53. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අථර්ානුකූලව සහ එහි කාය්ර සඳහා, මණ්ඩලයේ සාමාජිකයන් සහ නිලධරයන් සහ අනෙකුත් සියලු සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයක් ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අථර්ානුකූලව අධිකරණ ක්‍රියා පටිපාටියක් සේ සලකන ලැබිය යුතු ය.

54. මණ්ඩලය, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අථර්ානුකූලව උප ලේඛන ගත ආයතනයක විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය

55. මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ නො කර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහු විසින් හෝ ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එම ක්‍රියාව හෝ නො කර හැරීම සද්භාවයෙන් කරන ලද්දක් බවට අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී දී ඔහු විසින් අය කර ගනු ලැබුවේ නම් මිස, මණ්ඩලයේ අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

## මණ්ඩලයේ කටයුතු වාතර්ා කිරීම

56. (අ). අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන පරිදි නොයෙක් විට, එහෙත් එක් ලිත් වෂර්යකට යටත් පිරිසෙයින් එක් වාතර්ාවක් වත් වන සේ, මණ්ඩලය විසින් එහි කටයුතු පිළිබඳ වාතර්ා පිළියෙල කරනු ලැබිය යුතු ය. එසේ පිළියෙල කරනු ලබන සෑම වාතර්ාවක ම පිටපතක් මණ්ඩලය විසින් පාලර්ිමේන්තුවේ සභා ගත කිරීමට පාලර්ිමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු අතර, එක් එක් වාතර්ාවේ පිටපතක් ජනාධිපතිවරයාට ද යැවිය යුතු ය.

57. මණ්ඩලයේ කටයුතු පිළිබඳ ව ප්‍රගාමී ලෙස යාවත්කාලීන කළ යුතු තොරතුරු වලට අතිරේක ව (57) වන වගන්තිය යටතේ සකස් කරන ලද වාතර්ාවේ පිටපතක් පාලර්ිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් සති දෙකක් ඇතුළත දී, මණ්ඩලයේ වෙබ් අඩවියෙන් මහජනයාට දැන ගැනීමට සැලැස්විය යුතු ය.

## වැරදි

58. (අ)

i. ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක් මගින් සේවයේ යොදවා ඇති ජන මාධ්‍ය කරුවෙකු විසින් නීත්‍යානුකූල ව කරනු ලබන ප්‍රවෘත්ති හා තොරතුරු රැස් කිරීමක් අවහිර කරන ඕනෑම අයෙක්;

ii. මේ පනතේ (9) වැනි වගන්තියට පටහැණි ව රහස්‍ය තොරතුරු ප්‍රභවයක් හෙළිදරව් කරන ලෙස යම් පුද්ගලයෙකුට නියම කරන ඕනෑම අයකු;

iii. ප්‍රධාන සංස්කාරකයෙකු, ජනමාධ්‍ය කරුවෙකු හෝ ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක වෙනත් සේවකයෙකු, ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව පිළිබඳ ස්වාධීන මණ්ඩලය විසින් පිළිගනු ලැබූ

ව්‍යවහාර සංග්‍රහයක් කඩ කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා, අඩු සැලකිලි දැක්වීමකට හෝ, සම්බාධකයකට හෝ රැකියාව අවසන් කිරීමකට හෝ ලක් කරන ඕනෑම අයකු;

මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මහේස්ත්‍රාත්වරයෙකු විසින් කරනු ලබන ලඝු නඩු විභාගයක දී රුපියල් ලක්ෂයකට නො වැඩි දඩයකට හෝ මාස තුනකට නො වැඩි සිරදඬුවමකට හෝ එකී දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(ආ)

iv. මණ්ඩලයට චේතනාන්විත ව වැරදි සහගත, අසම්පූර්ණ හෝ නිවැරදි නොවන තොරතුරු සපයනු ලබන, ඔහු හෝ ඇයගේ සේවා නියුක්තිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ලබා ගත් දැනුම හෝ තමා වෙත ප්‍රවේශයක් ඇති තොරතුරු චේතනාන්විත ව විනාශ කරනු ලබන, අවලංගු කරනු ලබන, වෙනස් කරනු ලබන හෝ පූර්ණ හෝ අර්ධ වශයෙන් වසන් කරනු ලබන යම් අයකු;

v. මණ්ඩලය විසින් ඉල්ලා සිටීමේ දී මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන ඕනෑම අයකු ;

vi. මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිමින් මණ්ඩලය විසින් විභාග කිරීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරන ඔහුගේ භුක්තියේ හෝ බලය යටතේ පවතින යම් තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී හෝ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම් යටතේ චේතනාන්විත ව සාවද්‍ය තොරතුරු සපයනු ලබන ඕනෑම අයකු ;

vii. මේ පනත මගින් මණ්ඩලය වෙත හෝ එම මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී, මණ්ඩලය හෝ එහි යම් නිලධරයකු හෝ සේවා නියුක්තිකයකු වළක්වන හෝ අවහිර කරනු ලබන ඕනෑම අයකු ;

මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මහේස්ත්‍රාත්වරයෙකු විසින් කරනු ලබන ලඝු නඩු විභාගයක දී රුපියල් ලක්ෂයකට නො වැඩි දඩයකට හෝ මාස තුනකට නො

වැඩි සිරදඬුවමකට හෝ එකී දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. (ආ) උප වගන්තියේ සඳහන් වරදවල් මණ්ඩලය හෝ මණ්ඩලය විසින් මහේස්ත්‍රාත්වරයා වෙත යොමු කරනු ලබන වාතර්‍ාවකට අනුව (ආ) සිදු වී ඇති වරදවල් ලෙස මහේස්ත්‍රාත් අධිකරණය විසින් සැලකිය යුතු ය.

59. මණ්ඩලයේ තීරණයට කීකරු වීම හෝ තීරණය ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරන ඕනෑම ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක් මේ පනත යටතේ වරදක් සිදු කරන අතර මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාතර්‍ාවකට අනුව මහේස්ත්‍රාත් අධිකරණයක පැවැත්වෙන ලඝු නඩු විභාගයක දී රුපියල් දස ලක්ෂයක් දක්වා වූ, එහෙත් එහි විගණනය කරන ලද ආදායම් ප්‍රකාශය මත හෝ උසාවිය විසින් තීරණය කරනු ලබන සුදුසු ආකාරයකින් ගණනය කරනු ලබන පරිදි, එම ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයේ සතියක දළ ආදායමට නො වැඩි දඩයකට යටත් විය යුතු ය.

60. (අ). මේ පනත යටතේ පැනවීමට අවශ්‍ය වන නීති පැනවීමට මණ්ඩලයට හැකිය.

(ආ). මේ පනත යටතේ පැනවෙන සෑම නීතියක් ම පාලර්‍ිමේන්තුවේ සභා ගත කළ යුතු අතර මාස තුනක් නො ඉක්මවන සාධාරණ කාලයක් තුළ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

## *මණ්ඩලයේ මුද්‍රාව*

61. මණ්ඩලයේ මුද්‍රාව :
   - (අ). මණ්ඩලය විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය;
   - (ආ). මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය;
   - (ඇ). මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය; සහ
   - (ඈ). මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ සභාපතිවරයා සහ වෙනත් එක් සාමාජිකයකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට නො තැබිය යුතු අතර, ඒ දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් එකී සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය.

62. මේ පනතේ සිංහල හා දෙමළ පෙළ අතර නොගැළපීමක් ඇති වුව හොත් සිංහල පෙළ නිවැරදි වශයෙන් සැලකිය යුතු ය.

ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය
සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි

## අර්ථ දැක්වීම

63. සන්දර්භය විසින් අවශ්‍ය කරන විටක දී හැර, මේ පනත සම්බන්ධයෙන්,

(අ) 'ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක්' යනුවෙන් අදහස් කරන්නේ නිත්‍ය නාමයක් ඇති, අවම වශයෙන් මසකට වරක් වත් නිරන්තර ව පළ කරන, ශ්‍රී ලංකාව තුළ සිය කටයුතු පවත්වා ගෙන යන ප්‍රකාශකයෙකු විසින් ප්‍රකාශයට පත් කරනු ලබන, විශ්වාසදායක ප්‍රවෘත්ති හා තොරතුරු ප්‍රභවයක් ලෙස එම ප්‍රකාශනය සලකනු ලබන පොදු මහජනතාවකට හෝ ඉන් කොටසකට හෝ බෙදා හැරීම අරමුණු කොට ගත් මුද්‍රිත ප්‍රකාශනයකි.

(ආ) 'ප්‍රකාශකයා' යනුවෙන් අදහස් වෙන්නේ ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක් මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කරන තැනැත්තා හෝ නිසි බලපත්‍ර නිකුත් කරන ආයතනයකින් ලබාගත් විකාශන හෝ බෙදා හරින බලපත්‍රයක් හිමි ඒ බලපත්‍රය යටතේ විද්‍යුත් ජන මාධ්‍ය සේවයක් බෙදා හරින හෝ විකාශනය කරන තැනැත්තා ය.

(ඇ) 'විද්‍යුත් මාධ්‍ය සේවයක්' යනු භූමි පාදක විකාශන ක්‍රමයක් මගින් හෝ චන්ද්‍රිකාවක් මගින් හෝ රැහැන් ක්‍රමයක් මගින් හෝ එකවර මහජන පරිභෝජනය සඳහා බෙදා හරින, ගාස්තු ගෙවා හෝ නො ගෙවා ගුවන් විදුලි යන්ත්‍රයක්, රූපවාහිනී යන්ත්‍රයක් හෝ වෙනත් ඕනෑම අදාළ ඉලෙක්ට්‍රොනික උපකරණයක් මගින් ලබා ගත හැකි, නිසි බලධාරියෙකු විසින් නිකුත් කරන බලපත්‍රයක් යටතේ පවත්වා ගෙන යන, ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩසටහන් හෝ විකාශනය කරනු ලබන සේවාවකට ය. එසේ වුව ද පුද්ගලික හෝ ආණ්ඩුවේ ආයතනයක ආභ්‍යන්තරික සන්නිවේදන කටයුතු සඳහා යොදා ගනු ලබන හෝ අන්තර්ජාලය ඔස්සේ කරන සන්නිවේදනයක් එමගින් අදහස් නොවේ.

(ඈ) 'අන්තර්ජාල ප්‍රවෘත්ති මාධ්‍ය සේවාවක්' යනු ශ්‍රී ලංකාවෙන් උද්ගත වී මහජනතාව අරමුණු කොට ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක් හෝ

විද්‍යුත් මාධ්‍ය සේවයක් හා අනුරූප ව අන්තර්ජාලය ඔස්සේ බෙදා හරින ප්‍රවෘත්ති හා තොරතුරු සේවාවකටයි.

(ඉ) 'ප්‍රවෘත්ති සහ තොරතුරු' යන්නෙන් ප්‍රවෘත්ති මාධ්‍ය කියවන හෝ අසන හෝ නරඹන ග්‍රාහකයන් විසින් විශ්වාස දායක යයි සලකන පෙළ, චලන හෝ ස්ථිතික පින්තූර හෝ ශ්‍රව්‍යමය ද්‍රව්‍ය අදහස් වේ.

(ඊ) 'ප්‍රධාන කතර්ෘ' යනුවෙන් අදහස් වන්නේ, මේ පනතේ (12 ) වැනි වගන්තියට අනුව, ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයකින් නිකුත් වන අන්තගර්තය සම්බන්ධයෙන් අවසාන සංලේඛ්‍ය පාලනය කරන තැනැත්තා ය.

(උ) 'අයිතිකරු' යන්නෙන් අදහස් වන්නේ ප්‍රවෘත්ති මාධ්‍ය ආයතනයක සැලකිය යුතු හිමිකාරත්වයක් දරන තැනැත්තා වේ.

(ඌ)'මුද්‍රණකරු' යන්නෙන් අදහස් වන්නේ ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක් මුද්‍රණය කිරීම පිණිස ප්‍රකාශකයෙකු විසින් පත් කරනු ලබන හෝ ගිවිසුමකට එළඹෙන ඕනෑම තැනැත්තෙකි.

(එ) 'පුද්ගලයා' යන්නෙන් කායික හෝ නීතිමය පුද්ගලයෙකු සැලකේ

(ඒ) 'බෙදා හරින්නා' යන්නෙන් අදහස් වන්නේ ප්‍රවෘත්ති මාධ්‍ය ප්‍රකාශනයක් තොග වශයෙන් බෙදා හැරීම පිණිස ප්‍රකාශකයෙකු විසින් පත් කරනු ලබන හෝ ගිවිසුමකට එළඹෙන ඕනෑම තැනැත්තෙකි.

ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය
සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි

*උප ලේඛනය - I*

*(39 )- (එ) උප වගන්තිය*

# *මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ වන විධිවිධාන*

*1. මණ්ඩලයේ සාමාජිකයකු*

*(අ) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියකින් ඔහුගේ හෝ ඇයගේ ධුරයෙන් කලින් ඉල්ලා අස් වූ අවස්ථාවක දී;*

*(ආ) ජනාධිපතිවරයා විසින් මෙම උප ලේඛනයේ (2) දෙවැනි වගන්තියේ ප්‍රකාර ධුරයෙන් ඉවත් කරන අවස්ථාවක දී;*

*(ඇ) මාගර් නීති උල්ලංඝනය කිරීමක දී හැර නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරුවකු කරනු ලැබ ඇති අවස්ථාවක දී;*

*(ඈ)කොමිෂන් සභාවෙන් කලින් නිවාඩු ලබා ගැනීමකින් තොර ව මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට ඔහු හෝ ඇය නො පැමිණ සිටීමෙන් ධුරය හැර ගියා සේ සලකන අවස්ථාවක දී; හෝ ඔහුගේ හෝ ඇයගේ සාමාජිකත්වය අවසන් විය යුතු ය.*

*2. මණ්ඩලයේ සාමාජිකයකු*

*(අ) යම් සිහිවිකලභාවයක් හේතුවෙන් ඔහුගේ හෝ ඇයගේ කායර්යන් ඉටු කිරීමට ස්ථිර වශයෙන් නො හැකි අවස්ථාවක දී; හෝ*

*(ආ) චරිත දූෂණය මත ඔහු හෝ ඇයගේ රාජකාරි ඉටු කිරීමට සුදුසු තත්වයක නොමැති අවස්ථාවක දී; හෝ*

*අදාළ සාමාජිකයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට හා පාලර්මේන්තුවට කරුණු ඉදිරිපත් කිරීමට සාධාරණ අවස්ථාවක් ලබා දීමේ කොන්දේසිය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කරනු ලබන නිදෙර්ශයක් පරිදි සියලු ම පාලර්මේන්තු මන්ත්‍රීවරුන්ගේ තුනෙන් දෙකකට වැඩි ඡන්දයකින් පාලර්මේන්තුව විසින් සම්මත කර ගනු ලබන යෝජනාවකට අනුව ජනාධිපති තුමා විසින් ඉවත් කළ හැකිය.*

*3. ජනාධිපතිවරයා අමතා තත්කායර් සඳහා යවනු ලබන ලිපියක් මගින් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට සිය ධුරයෙන් ඉල්ලා අස් විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් ලිඛිත ව පිළිගන්නා දිනයේ සිට බලාත්මක විය යුතු ය.*

*4. මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ ධුරය හිස් වන අවස්ථාවක දී, එකී සාමාජිකයාගේ ධුර කාලයෙන් මාස හයක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් ඉතිරි ව ඇත්නම් අදාළ සාමාජිකයාගේ නාම යෝජනා කරනු ලැබූ ප්‍රවගර්යෙන් පනතේ (30) වන වගන්තියේ සඳහන් කායර් පටිපාටිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිදෙර්ශ කරනු*

*ලබන වෙනත් පුද්ගලයෙකු ජනාධිපතිවරයා විසින්, අනුප්‍රාප්ති වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරීමට පත් කරනු ලැබිය යුතු ය.*

5. *මණ්ඩලයේ සාමාජිකයකු අසනීපයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුගේ හෝ ඇයගේ කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නො හැකි වන අවස්ථාවක දී, ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීමට ඔහු හෝ ඇය නො පැමිණි කාලය සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය මත මණ්ඩලය විසින් නිදෙර්ශ කරන වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය;*

6. *ප්‍රවාහනය, නවාතැන් සහ දෛනික යැපීම් දීමනා ඇතුළුව මණ්ඩලයේ කායර්න් ඉටු කිරීමේ දී මණ්ඩල සාමාජිකයන් විසින් දරන වියදම් ඔවුන්ට ගෙවිය යුතු ය.*

7. *කල් තියා තීරණය කරන ලද හෝ සභාපතිවරයා විසින් කැඳවනු ලබන මණ්ඩලයේ රැස්වීම් වලට පැමිණීම පිණිස මණ්ඩලය විසින් දීමනාවක් සභාපති වරාය ද ඇතුළු සියලු සාමාජිකයන්ට එක සමාන පදනමකින් ලැබිය යුතු ය.*

8. *නිසි ගණපූරණය ඇති තාක් මණ්ඩලයෙ සාමාජිකයන් ගේ පුරප්පාඩුවක් හෝ ඉල්ලා අස්වීමක් නිසා හෝ මණ්ඩලයේ රැස්වීමක තීරණ අවලංගු නොවන්නේය.*

ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය
සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි

# *උප ලේඛනය - II*

*37 (ආ) (xiv) උප වගන්තිය*

## *මහජන අදහස් විමසීම පිළිබඳ විධිවිධාන*

1. *මණ්ඩලය මහජන අදහස විමසීමක් පවත්වන්නේ නම්:*
    1. *මහජන අදහස් විමසීමක් සිදු කරන බවට;*
    2. *එම මහජන අදහස් විමසීම ක්‍රියාත්මක වන කාල පරිච්ඡේදය*
    3. *මහජන අදහස් විමසීම හා සම්බන්ධ කාරණයේ ස්වභාවය*
    4. *එම කරණය සම්බන්ධයෙන් මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීමට නියමිත කාල පරිච්ඡේදය සහ ආකාරය සහ*
    5. *කරුණු ඉදිරිපත් කළ යුතු ලිපිනය*

    *දැන්වීමක් මගින් පළ කළ යුතු ය.*

2. *මහජන අදහස් විමසීමක් කරන විට මණ්ඩලය ඒ සම්බන්ධයෙන්:*

    *(අ). මණ්ඩලයේ මතය අනුව කාරණයට අදාළ වන ප්‍රශ්න සහ*

    *(ආ). මණ්ඩලය අදහස් කරන ආකාරයට එම ප්‍රශ්න පිළිබඳ පසුබිම් විස්තර කරුණු ඇතුළත්*

    *සාකච්ඡා පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කළ යුතු ය.*

3. *ඕනෑම මහජන අදහස් විමසීමක් සම්පූර්ණ කොට මාස තුනක් ගත වීමට පෙර මණ්ඩලය අදාළ වෙතැයි සලකන ප්‍රමාණයට එම මහජන අදහස් විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ යුතු අතර මේ පනත යටතේ පවරා ඇති කටයුතු හා වගකීම් ඉටු කිරීමේ දී ද, බලය භාවිත කිරීමේ දී ද එම මහජන අදහස් විමසීම් වල ප්‍රතිඵල සැලකිල්ලට ගත යුතු ය.*

4. *මේ කොටස සම්බන්ධයෙන් දැන්වීම්, ලේඛන සහ තොරතුරු පළ කිරීමේ දී මණ්ඩලයේ වෙබ් අඩවියේ ඒවා පළ කරනු ලැබිය හැකි අතර මණ්ඩලයේ කාර්යාල වල ද තැබිය යුතු ය. එයට අමතරව එවැනි දැන්වීම්, ලේඛන සහ තොරතුරු ඒ ගැන උනන්දුවක් දක්වන සියලු පාර්ශ්ව වල අවධානයට යොමු කිරීම සඳහා සුදුසු යයි මණ්ඩලය සිතන ආකාරයකට පළ කල හැක්කේ ය.*

2017/1-**2**

**ස්වාධීන ප්‍රවෘත්ති මාධ්‍ය තත්ත්ව මණ්ඩලය**
**සංශෝධිත පළමුවැනි සාකච්ඡා කෙටුම්පත - මුල් කෙටුම්පත ඉංග්‍රීසි බසිනි**

**ප්‍රථම මුද්‍රණය - 2017 මැයි**

**විජයානන්ද ජයවීර**

@ **ප්‍රකාශනය**
**ජනමාධ්‍ය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වන ජාතික ලේකම්** කාර්යාලය

**අංක 58/19, පාසල් පටුමඟ, නාවල, රාජගිරිය**
වෙබ් අඩවිය *http://www.nsmrlk.org*
ඊ-මේල් *secretariat@nsmrlk.org*